# <u>ව්‍යාපාර සංවිධාන</u>

**"කිසියම් පොදු අරමුණක් ඉටු කර ගැනීම සඳහා එක්ව කටයුතු කරන පුද්ගලයන්ගේ එකතුවක්" සංවිධානයක් ලෙස හඳුන්වයි. <u>අරමුණක් තිබීම, සංවිධාන ව්‍යුහයක් තිබීම, පුදගලයන් සිටීම, සංවිධාන සංස්කෘතියක් තිබීම</u> ආදිය සෑම සංවිධානයකටම පොදු ලක්ෂණ වේ.**

**ලාභ අරමුණින් හෝ සුභසාධන අරමුණින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවිය හා අනුබද්ධ වූ සංවිධාන "ව්‍යාපාර සංවිධාන" ලෙස හඳුන්වයි. අරමුණක් තිබීම, ව්‍යාපාර නාමයක් පැවතීම, පුද්ගලයන් සිටීම, පැවැත්මක් තිබීම, සංවිධාන ව්‍යුහයක් තිබීම, ආර්ථික කටයුත්තක නියැලීම ව්‍යාපාර සංවිධානයකට පොදු ලක්ෂණ වේ.**

## <u>ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම</u>

**ව්‍යාපාර සංවිධාන හිමිකාරිත්වය මත රාජ්‍ය හා පෞද්ගලික ලෙස වර්ග කල හැකිය.**

*<u>පෞද්ගලික අංශයේ ව්‍යාපාර</u>*

1. *කේවල ස්වාමි ව්‍යාපාර*
2. *හවුල් ව්‍යාපාර*
3. *සංස්ථාපිත සමාගම්*
    a. *සීමා සහිත සමාගම්*
        i. *සීමාසහිත පුද්ගලික සමාගම්*
        ii. *සීමාසහිත පොදු සමාගම්*
            1. *ලැයිස්තුගත සමාගම්*
            2. *ලැයිස්තුගත නොවූ සමාගම්*
        iii. *අක්වෙරල සමාගම්*
    b. *සීමා රහිත සමාගම්*
    c. *ඇපයෙන් සීමිත සමාගම්*
4. *සමුපකාර*
5. *විශේෂිත ව්‍යාපාර*
    a. *වරලත් ව්‍යාපාර*
    b. *බද්ධ ව්‍යාපාර*
    c. *සංයෝජන*

*<u>රාජ්‍ය අංශයේ ව්‍යාපාර</u>*

1. *මධ්‍යම රජය සතු ව්‍යාපාර*
    a. *රාජ්‍ය සමාගම්*
    b. *රාජ්‍ය දෙපාර්තමේන්තු*
    c. *රාජ්‍ය සංස්ථා*
2. *පළාත් සභා සතු ව්‍යාපාර*
3. *පළාත් පාලන ආයතන සතු ව්‍යාපාර*

## <u>කේවල ස්වාමි ව්‍යාපාර</u>

අයිතිය තනි පුද්ගලයෙකු සතු ව්‍යාපාර කේවල ස්වාමි ව්‍යාපාර ලෙස හඳුන්වයි.

### <u>කේවල ස්වාමි ව්‍යාපාරයක ලක්ෂණ</u>

- අයිතිය තනි පුද්ගලයෙකු සතු වීම.
- අයිතිකරු විසින් තනිවම ප්‍රාග්ධනය සැපයීම.
- අයිතිකරු විසින්ම පරිපාලනය සිදු කරන අතර අයිතිකරුම බොහෝ විට කළමනාකරු වීම.
- වගකීම අසීමිත වීම. *එනම් ව්‍යාපාරය බුන්වත් උවහොත් භාහිර වගකීම් පියවීම සඳහා තම පෞද්ගලික දේපල පවා කැප කිරීමට සිදුවේ. එනම් යෙදූ ප්‍රාග්ධනයට පමණක් වගකීම සීමා නොවේ.*
- නෛතික පුද්ගලබවක් නොමැති වීම. එනම් නිතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස පිලි නොගනියි. *එනම් ව්‍යාපාරය නමින් බදු ගෙවීම, ගිවිසුම් වලට එළඹීම, දේපල අත්පත් කර ගැනීම, නියෝජිතයන් පත් කිරීම කල නොහැකිය.*
- ලියාපදිංචිය අනිවාර්ය නොවීම. *නමුත් අයිතිකරුවන්ගේ සත්‍ය නමින් හැර ව්‍යාජ නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ නම් 1918 ව්‍යාපාර නාම ආඥා පනත අනුව පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කල යුතුය.*
- ලාභ තනිවම භුක්ති විදින අතර අලාභ තනිවම විඳදරා ගත යුතුය.
- ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය නොවේ.
- අඛණ්ඩ පැවැත්මක් නොමැත.

### <u>කේවල ස්වාමි ව්‍යාපාරය වාසි-අවාසි</u>

| වාසි/ හිතකර ලක්ෂණ | අවාසි/ සීමා |
|---|---|
| • ස්වාධීනව කටයුතු කල හැකි වීම.<br>• ලාභ තනිවම භුක්ති විදිය හැකි වීම.<br>• පෞද්ගලික කැපවීම මත ව්‍යාපාරය දියුණු කල හැකි වීම.<br>• කුඩා ප්‍රාග්ධනයක් ප්‍රමාණවත් වීම.<br>• නීතිමය බලපෑම අඩුයි.<br>• ලියාපදිංචිය අනිවාර්ය නොවීම.<br>• ව්‍යාපරික රහස්‍යභාවය ආරක්ෂා වීම. | • වගකීම අසීමිත වීම.<br>• අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.<br>• ප්‍රාග්ධන මාර්ග සීමිත වීම<br>• නෛතික පුද්ලභාවයක් නොමැති වීම.<br>• පාඩු තනිවම විඳ දරා ගත යුතු වීම.<br>• තනි තීරණ සැම විටම සාර්ථක නොවීම.<br>• ව්‍යාපාරය පුළුල් වන විට කළමනාකරණය අපහසු වීම. |

### <u>කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම</u>

1. ව්‍යාපාරය ඇරඹීමට අපේක්ෂිත ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍රයක් ලබා ගැනීම.
2. ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා ග්‍රාම නිලධාරී වාර්තාව ලබා ගැනීම.
3. ග්‍රාම නිලධාරී සහතික කල වාර්තාව සහ සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රය ලියාපදිංචියට අදාළ ගාස්තු ද සමග ප්‍රාදේශීය ලේකම් වෙත භාර දීම.
4. ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරුව ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම.

## <u>හවුල් ව්‍යාපාර</u>

"ලාභ ලැබීමේ පොදු අරමුණින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයන් අතර පවත්නා ව්‍යාපාරික සම්බන්ධතාව" හවුල් ව්‍යාපාරයක් නම් වේ.

### <u>හවුල් ව්‍යාපාරයක අනිවාර්ය ලක්ෂණ</u>

- ලාභ අරමුණ
- පුද්ගලයන් සිටීම
- ව්‍යාපාරයක් තිබීම.
- ගිවිසුමක් තිබීම.

### <u>හවුල් ව්‍යාපාරයක ලක්ෂණ</u>

- හවුල්කරුවන් සංඛ්‍යාව 2-20 ත් අතර වීම.
- හවුල්කරුවන් සාමූහිකව ප්‍රාග්ධනයට දායක වීම.
- අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වය
  *සෑම හවුල්කරුවෙකුම තමාගේ හා සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු හා ප්‍රධානියෙකු වන බව මින් අදහස් වෙයි.*
- වගකීම අසීමිත වීම.
- හවුල්කරුවන් විසින් කළමනාකරණ කටයුතු සිදු කිරීම.
- ලාභාලාභ ගිවිසගත් පරිදි බෙදා ගැනීම.
- නෛතික පුද්ගලබවක් නොමැති වීම.
- ලියාපදිංචිය අනිවාර්ය නොවීම. *නමුත් හවුල්කරුවන්ගේ සත්‍ය නමින් හැර ව්‍යාජ නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ නම් 1918 ව්‍යාපාර නාම ආඥාපනත යටතේ ලියාපදිංචි කල යුතුය.*
- ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය නොවීම.

### <u>හවුල් ව්‍යාපාරයක වාසි-අවාසි</u>

| වාසි | අවාසි |
|---|---|
| • වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.<br>• සාමූහික තීරණ ගතහැකි වීම.<br>• අලාභ/ අවධානම බෙදී යාම.<br>• විවිධ හැකියාවන් සහිත පුද්ගලයන් එකතු කර ගත හැකිවීම.<br>• පහසුවෙන් ආරම්භ කල හැකි වීම.<br>• සාමූහික වගකීම නිසා ඇතිවන උනන්දුව | • වගකීම අසීමිත වීම.<br>• ලාභය බෙදී යාම.<br>• නෛතික පුද්ගලබවක් නොමැති වීම.<br>• හවුල්කරුවන් අතර මතභේද ඇති වීමට ඇති ඉඩකඩ<br>• අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.<br>• එක් හවුල්කරුවකුගේ ක්‍රියාකලාපය මුළු හවුල් ව්‍යාපාරයටම බලපෑම. |

හවුල් ගිවිසුම

හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් හවුල්කරුවන් අතර ඇති කරගන්නා එකගතාවය “හවුල් ගිවිසුම” ලෙස හඳුන්වයි.

හවුල් ගිවිසුමක් වාචිකව, ලිඛිතව හෝ ව්‍යංගයෙන් ඇති විය හැකිය.

හවුල්කරුවන් අතර ඇති කර ගන්නා ගිවිසුම ලිඛිතව පවත්වාගෙන යන්නේ නම් එය “*හවුල් ඔප්පුව/ හවුල් ව්‍යවස්ථාවලිය*” ලෙස හඳුන්වයි. හවුල්කරුවන් අතර මතභේද පහසුවෙන් විසදා ගැනීමට සහ හවුල් ව්‍යාපාරයේ කටයුතු පහසුවෙන් කරගෙන යාම සදහා හවුල් ඔප්පුව වැදගත් වේ.

හවුල් ගිවිසුමක ඇතුළත් විය හැකි කරුණු

- ප්‍රාග්ධනය යෙදීම පිළිබඳ විස්තර
- ලාභාලාභ බෙදා ගන්නා ආකාරය
- නව හවුලක්රුවන් බඳවා ගැනීම පිලිබඳ කොන්දේසි
- හවුල්කරුවෙකුගේ ඉවත්වීමකදී කටයුතු කරන ආකාරය
- ගැනිලි පිලිබඳ සීමා
- ප්‍රාග්ධන පොළී, ගැනිලි පොළී, හවුල්කරුවන් ව්‍යාපාරයට අමතරව සපයන ණය සදහා පොළී
- අමතර ප්‍රාග්ධනය ලබාදීම සම්බන්ධ කොන්දේසි
- කීර්තිනාමය ගණනය කරන ආකාරය

හවුල් ව්‍යාපාරයක ගිවිසුමක් නොමැති විට හෝ ගිවිසුමේ සඳහන් නොවන කරුණක් සම්බන්ධ අවස්ථාවකදී හවුල් ආඥාපනතේ 24 වගන්තියට අනුව කටයුතු කල යුතුය. ඒ යටතේ,

1. ලාභාලාභ සමසමව බෙදා ගත යුතුය.
2. ප්‍රාග්ධනයට පොළී හිමි නොවේ.
3. ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවන් පෞද්ගලිකවම දරන ලද වියදම් ව්‍යාපාරය විසින් නැවත ඔවුන්ට ගෙවිය යුතුය.
4. හවුල්කරුවන් ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සදහා 5% ක වාර්ෂික පොළියක් හිමිවේ.
5. සෑම හවුල්කරුවෙකුටම ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු වලට දායක වීමට අයිතියක් ඇත.
6. හවුල්කරුවන්ට වේතන හිමි නොවේ.
7. ගැනිලි සඳහා පොළියක් අය නොකළ යුතුය.
8. හවුල්කරුවන් සියලු දෙනාගේ එකගත්වයෙන් තොරව නව හවුල්කරුවෙකු බඳවාගත නොහැකිය.

හවුල් ව්‍යාපාරයකට බලපාන නීතිරීති

| | |
|---|---|
| 1890 හවුල් ආඥාපනත | හවුල් ව්‍යාපාරයක ස්වභාවය සහ හවුල් ගිවිසුමක් නොමැති විට කටයුතු කරන ආකාරය |
| 2007 අංක 07 දරණ සමාගම් පනත | හවුල් ව්‍යාපාරයක සිටිය යුතු උපරිම සාමාජික සංඛ්‍යාව 20 බව |
| 1840 වංචා වැළක්වීමේ ආඥා පනත | රු 1000 ට වැඩි ප්‍රාග්ධනයකින් අරඹන හවුල් ව්‍යාපාර අනිවාර්යෙන්ම ලිඛිත ගිවිසුමකින් ආරම්භ කල යුතු බව |
| 1918 ව්‍යාපාර නාම ආඥාපනත | ව්‍යාජ නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචි කලයුතු බව |

## <u>සංස්ථාපිත සමාගම්</u>

**2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථා කරන ලද පුද්ගලයන්ගේ එකතුවක් සමාගමක් ලෙස හැදින්විය හැකිය.**

<u>සංස්ථාපිත සමාගම් වල සුවිශේෂී ලක්ෂණ</u>

1. සාමාජිකයන්ගෙන් වෙන් වූ නීතිමය ඒකකයක් වීම / නෛතික පුද්ගලබවක් පැවතීම.
2. වගකීම සීමිත හෝ අසීමිත වීම.
3. අඛණ්ඩ පැවැත්මක් තිබීම / නිත්‍ය සන්තතික හැකියාව
4. සංස්ථාපනය කිරීම අනිවාර්ය වීම.
5. ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය වීම.
6. කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදු වීම.

<u>සංස්ථාපිත සමාගමක වාසි-අවාසි</u>

| වාසි | අවාසි / සීමා |
|---|---|
| • නෛතික පුද්ගලබවක් පැවතීම.<br>• වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම.<br>• අඛණ්ඩ පැවැත්මක් තිබීම.<br>• මහා පරිමාණ පිරිමැසුම් අත්කරගත හැකි වීම. | • ආරම්භ කිරීමට වැඩි පිරිවැයක් දැරිය යුතු වීම.<br>• රජයේ බලපෑම් වැඩි වීම.<br>• ලාභ ද්විත්ව බදු ගණනයට යටත් වීම, *එනම් සමාගම් ලාභ සහ කොටස්කරුවන්ට ගෙවන ලාභාංශ මතද බදු ගෙවීමට සිදු වීම.*<br>• විසිරුවා හැරීම සංකීර්ණ වීම. |

<u>සමාගමක් ලියාපදිංචි කිරීම</u>

සමාගමක් ලියාපදිංචි කිරීම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ටාර්වරයා වෙත සිදු කල යුතුය.එහිදී,

1. සමාගම් නාමය ලියාපදිංචි කිරීම.
2. සමාගම් නාමය ස්ථිර වූ පසු පහත ලියවිලි ඉදිරිපත් කල යුතුය.
   a. නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම්පත්‍රය
   b. සාංසමික ව්‍යවස්ථාවලිය
   c. ආරම්භක අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත දක්වන ප්‍රකාශයක්
   d. ආරම්භක ලේඛම්වරයාගේ කැමැත්ත දක්වන ප්‍රකාශයක්
3. අදාළ ලියවිලි නිවැරදි බවට තහවුරු වූ පසු හා නියමිත ගාස්තු ගෙවීමෙන් අනතුරුව සමාගම් රෙජිස්ටාර්වරයා විසින් සංස්ථාපන සහතිකය නිකුත් කරයි.

- <u>සාංසමික ව්‍යවස්ථාවලිය</u>

  සමාගමේ පරමාර්ථ, කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් හා බැදීම්, සමාගමේ කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ කරුණු ඇතුළත් ලියවිල්ලයි.

- <u>සංස්ථාපන සහතිකය / සම්මුති සහතිකය / සංස්ථාගත සහතිකය</u>
  කිසියම් සංවිධානයක්, සමාගමක් ලෙස ලියාපදිංචි කල බවට එම සමාගම වෙත නිකුත් කරනු ලබන සහතිකයයි. මෙහි සමාගමේ නම හා අංකය, සංස්ථාගත කල දිනය ,සමාගම් වර්ගය ආදී තොරතුරු ඇතුළත් වේ.

1. <u>සීමාසහිත සමාගම්</u>
කොටස්කරුවන් මිලදී ගත් හෝ කොටස් වෙනුවෙන් ගෙවීමට බැදී සිටින වටිනාකමට පමණක් වගකීම සිමා වන සමාගම් සීමාසහිත සමාගම් ලෙස හදුන්වයි.

a. <u>සීමාසහිත පෞද්ගලික සමාගම්</u>
කොටස් සහ ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට අවසර නොමැති, අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් සහ උපරිමය 50ක් වන සමාගම් වේ.
<u>ලක්ෂණ</u>
- අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් වන අතර උපරිමය 50ක් වේ.
- අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව එකකි.
- සමාගමේ කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කල නොහැකිය.

| වාසි | අවාසි |
|---|---|
| • සමාගමේ අයිතිය සුළු පිරිසක් අතර තබා ගත හැකිවීම.<br>• ලාභ සුළු පිරිසක් අතර බෙදී යාම.<br>• සාපේක්ෂව ඇරඹීම පහසුය.<br>• නීතිමය අවශ්‍යතා අඩුය. | • උපරිම සාමාජික සංඛ්‍යාව 50 කට සීමා වීම.<br>• කොටස් නිදහසේ පැවරිය නොහැකි වීම.<br>• පැවැත්ම අඛණ්ඩ නොවීම.<br>• සාපේක්ෂව වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත නොහැකි වීම. |

b. <u>සීමාසහිත පොදු සමාගම්</u>
කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ මහජනතාවට නිකුත් කල හැකි, අවම කොටස්කරුවන් එකක් හා උපරිමය සීමාවක් නොමැති සමාගම් වේ.
<u>ලක්ෂණ</u>
- අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් හා උපරිමය සීමාවක් නොවීම.
- අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව දෙකකි.
- කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කල හැකි වීම.

| වාසි | අවාසි |
|---|---|
| • සාපේක්ෂව වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකිවීම.<br>• ණය ප්‍රාග්ධනය ලබා ගත හැකි වීම.<br>• කොටස් වෙළඳපල තුළ ගනුදෙනු කල හැකි වීම.<br>• කොටස් නිදහසේ පැවරිය හැකි වීම.<br>• රජයේ පිළිගැනීම ඉහළ වීම. | • ආරම්භ කිරීමට පිරිවැය අධික වීම හා සංකීර්ණ වීම.<br>• අලාභ, පාඩු ව්‍යාපාරය තුලම රැදීම.<br>• කළමනාකරණය සංකීර්ණ හා දුෂ්කර වීම.<br>• සුළු කොටස් හිමියන්ට පාලනයට හවුල් වීමට ඇති ඉඩකඩ අවම වීම. |

c. <u>අක්වෙරල සමාගම්</u>
ශ්‍රී ලංකාවෙන් පිටත ව්‍යාපාර කටයුතු කරගෙන යාම සදහා මෙරට සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන සමාගම් ‘‘අක්වෙරල සමාගම්’’ ලෙස හදුන්වයි.

2. <u>සීමාරහිත සමාගම්</u>
   කොටස්කරුවන්ගේ වගකීම අසීමිත වන සමාගම් සීමාරහිත සමාගම් වේ.

3. <u>ඇපයෙන් සීමිත සමාගම්</u>
   කොටස් නිකුත් කිරීමක් සිදු නොකරන, සාමාජිකයන්ගේ වගකීම සාංසමික ව්‍යවස්ථාවලියේ සඳහන් ඇප වටිනාකමට සීමා වන සමාගම් ඇපයෙන් සීමිත සමාගම් නම් වේ. අවම සාමාජික සංඛ්‍යාව දෙකක් වන අතර උපරිමය සීමාවක් නැත. මේවා පොදු පරමාර්ථ පෙරදැරි කරගෙන ආරම්භ කරන අතර ලාභ බෙදාහැරීමක් සිදු නොකරයි.

<u>විදේශ සමාගම්</u>
ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කර ඇති, ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාර කටයුතු කිරීම සඳහා මෙරට සමාගම් පනත යටතේද සංස්ථාපනය කරන සමාගම් විදේශ සමාගම් ලෙස හඳුන්වයි.

<u>නිල ලැයිස්තුගත සමාගම් / මිලකළ සමාගම්</u>
කොටස් වෙළඳපල මගින් සිය කොටස් විකිණීම සඳහා කොටස් වෙළඳපලේ නාම ලේඛනයට ඇතුළත් කර ඇති පොදු සමාගම්

- කොටස් වෙළඳපලේ ලේඛනගත වීම තුළින් ඇති වන වාසි
  1. විශාල ප්‍රාග්ධන ප්‍රමාණයක් පහසුවෙන් රැස් කර ගත හැකි වීම.
  2. අරමුදල් රැස් කිරීමේ පිරිවැය අවම වීම.
  3. සමාගමේ කිර්තිනාමය සහ ප්‍රතිරූපය වර්ධනය වීම.
  4. මූල්‍ය අවධානම විවිධාංගිකරණය කරගත හැකි වීම.
  5. සමාගම පිලිබඳ බාහිර පාර්ශ්වයන්ට දැනගත හැකි වීම.

<u>නිල ලැයිස්තුගත නොවූ සමාගම් / මිලනොකළ සමාගම්</u>
කොටස් වෙළඳපල නාමලේඛනයේ නම ඇතුළත් නොමැති පොදු සමාගම්

<u>සීමාසහිත පොදු සමාගම් ආර්ථික වර්ධනයට දායක වන ආකාරය</u>

1. දළ ජාතික නිෂ්පාදිතයට වැඩි දායකත්වයක් දැක්වීම.
2. රැකියා අවස්ථා වැඩි වැඩියෙන් බිහිවීම.
3. නවීන තාක්ෂණය යොදා ගැනීම.
4. තරඟකාරිත්වයට මුහුණදීමේ ශක්තිය ඉහළ වීම.
5. ආර්ථිකය තුළ ඉතිරිකිරීම් ඉහළ යාම.
6. විදේශ වෙළඳපලට පිවිසීම පහසු වීම.

සමාගම් වර්ග එකිනෙක සැසඳීමේදී පහත නිර්ණායක යොදා ගනියි.

a. සාමාජික සංඛ්‍යාව
b. වගකීම
c. ප්‍රාග්ධන සම්පාදනය
d. පරිපාලනය හා කළමනාකරණය

## සමුපකාර

**"සිය ආර්ථික, සමාජයීය හා සංස්කෘතිකම ය අවශ්‍යතා හා අපේක්ෂා ඉටු කර ගැනීම උදෙසා ස්වේච්ඡාවෙන් එක්සත් වූ පුද්ගලයින්ගේ ස්වාධීන සංගමයක්, මෙන්ම සාමූහික අයිතිය හා ප්‍රජාතන්ත්‍රවාදිව පාලනය වන සංවිධානයකි"**

සමුපාකාර ව්‍යාපාර වල විශේෂ ලක්ෂණ

1. සාමාජිකයන්ගේ සාමූහික අයිතිය
2. ප්‍රජාතන්ත්‍රවාදිව පාලනය වීම.
3. එක් සාමාජිකයෙකුට එක් ඡන්දය බැගින් හිමි වීම.
4. උපයන අතිරික්තය සාමාජිකයන් සමිතිය සමග කල ගනුදෙනුවල වටිනාකම අනුව සාමාජිකයන් අතර බෙදා හැරීම.
5. ලාභය මූලික අරමුණ නොවීම.
6. කොටස් වල අගය ස්ථාවරව පැවතීම.
7. ණය සඳහා ගෙවිය හැකි පොළී මට්ටම සීමිත වීම.
8. ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය වීම.
9. ලියාපදිංචිය අනිවාර්ය වීම.
10. වගකීම සීමිතයි.
11. අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වීම.

සමුපකාර ප්‍රතිපත්ති

**1995 දී මැන්චෙස්ටර් සමුළු සංවිධානය විසින් සමුපාකාර ප්‍රතිපත්ති 07 ඉදිරිපත් කර ඇත.**

1. ස්වේච්ඡාමය හා විවෘත සාමාජිකත්වය
   ජාති, ආගම, කුල-භේද, ස්ත්‍රී-පුරුෂ බව භේදයකින් තොරව ඕනෑම අයෙකුට සාමාජිකත්වය ලබා ගත හැකිය.

2. ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය
   සෑම සාමාජිකයෙකුටම හිමි වන්නේ එක් ඡන්දයක් පමණි.

3. සාමාජික ආර්ථික සහභාගිත්වය
   සමුපාකාර සමිති ප්‍රාග්ධනයට එහි සාමාජිකයෝ සාධාරණ අයුරින් දායක විය යුතු අතර අතිරික්තය සාමාජිකයන්ගේ යහපත වෙනුවෙන් ඔවුන් අතර බෙදාහැරිය යුතු ය.

4. ස්වෛරීභාවය හා නිදහස
   සමුපකාර සමිති ඒවායේ සාමාජිකයන්ගේ පාලනයට යටත් නිදහස් ආයතන බව

5. සමුපාකාර සමිති අන්තර් සහයෝගතාව
   සමුපාකාර සමිති ඒවායේ සාමාජිකයන්ට ඉතා ශක්තිමත් හා ඵලදායි සේවයක් සැපයීම වෙනුවෙන් ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සහයෝගයෙන් කටයුතු කල යුතුය.

6. සමුපකාර අධ්‍යාපනය හා පුහුණුව

7. සමාජය පිලිබඳ සැලකිලිමත් වීම
   සමුපකාර සමිති සාමාජික අවශ්‍යතා හා අපේක්ෂාවන් කෙරෙහි අවධානය යොමු කල යුතු අතර සමාජයේ තිරසර සංවර්ධනයක් බිහිකරලීම උදෙසා කටයුතු කල යුතුය.

සමුපාකාර ව්‍යාපාරයේ වාසි-අවාසි

| වාසි | අවාසි |
|---|---|
| • ආරම්භ කිරීම පහසු වීම.<br>• ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය වීම.<br>• විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාර කටයුතු කල හැකි වීම.<br>• උපයන අතිරික්තය සාමාජිකයන් සතු වීම.<br>• සාමාජික වගකීම සීමාසහිත වීම.<br>• නෛතික පුද්ගලභාවයක් පැවතීම.<br>• සමානාත්මතාවය | • මූල්‍ය සම්පාදන මාර්ග සීමිත වීම.<br>• සමුපාකාර ප්‍රතිපත්ති මත ම පිහිටා කටයුතු කල යුතු වීම.<br>• සීමිත කාලයක් පමණක් විවෘතව පැවතීම.<br>• රාජ්‍ය අංශයේ බලපෑම<br>• ණයට භාණ්ඩ අලෙවි නොකිරීම.<br>• කළමනාකරණ මණ්ඩලය ඡන්දයෙන් තෝරා පත් වන නිසා අකාර්යක්ෂම වීම.<br>• ආර්ථික දීරිගැන්වීම් ප්‍රමාණවත් නොවීම. |

සමුපකාරයක් ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකාවේ සමුපකාර ලියාපදිංචි කිරීම 1972 අංක 05 දරණ සමුපකාර සමිති පනත යටතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ, සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා යටතේ සිදුවේ.

සමුපකාරයක් ලියාපදිංචි කිරීම සඳහා පහත ලියවිලි සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත ඉදිරිපත් කල යුතුය.

1. අයදුම් පත්‍රය
2. අතුරු ව්‍යවස්ථාවලියේ පිටපත් දෙකක්
3. යෝජිත ආර්ථික කටයුතු වල යෝග්‍යතාව දැක්වෙන වාර්තාවක්
4. සමුපාකාර සමිතිය ලියාපදිංචිය සඳහා යෝජනා සම්මත වූ මහසභා රැස්වීමේ වාර්තාව
5. සාමාජික මුදල් පරිහරණ වාර්තාවක් (කාරක සමිතියේ වාර්තාවක්)
6. සමිතිය පිහිටි ස්ථානය දක්වන මාර්ග සටහනක්

සමුපකාර ව්‍යාපාරයේ නව ප්‍රවණතා

1. ස්වයංසේවා වෙළඳසැල් ආරම්භ කිරීම හා වෙළඳසැල් නවීකරණය කිරීම
   උදා: *කෝප් සිටි, කෝප් සුපර්*
2. නව ව්‍යාපාර ක්ෂේත්‍ර වලට පිවිසීම
   උදා: *රක්ෂණ, ඉන්ධන පිරවුම්හල්*
3. ජංගම වෙළඳසැල් ආරම්භ කිරීම
4. විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිතය
   උදා: *ණයපත්, හරපත්*

සමුපාකාර අකාර්යක්ෂමවීමට හේතු

1. වෙනත් ව්‍යාපාර සමග තරග කිරීමට ඇති නොහැකියාව
2. රාජ්‍ය අංශයේ බලපෑම් හා පරිපාලනයට රාජ්‍ය අංශය ඇගිලි ගැසීම
3. වංචා දූෂණ අධික වීම
4. ප්‍රසන්න හා ක්‍රමවත් ලෙස වෙළඳසැල් සකස් නොකිරීම
5. ගුණත්වයෙන් අඩු බාල භාණ්ඩ අලෙවි කිරීම
6. සීමිත කාලයක් පමණක් විවෘතව තැබීම
7. ණයට භාණ්ඩ අලෙවි නොකිරීම
8. තෝරා ගැනීමට ඇති ඉඩකඩ සීමා වීම
9. සේවකයින්ට ඉතා පහළ මට්ටමේ ප්‍රතිලාභ හිමි වීම

සමුපාකාර කාර්යක්ෂම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

1. විවෘතව තබන වේලාව දීර්ඝ කිරීම
2. ණයට භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීම.
3. කළමනාකරණ මණ්ඩලයට පළපුරුදු හා දක්ෂ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම.
4. නව ප්‍රවර්ධන ක්‍රම භාවිතය
5. ස්වයංසේවා ක්‍රමය ව්‍යාප්ත කිරීම
6. වෙළඳසැල් දර්ශනීය ලෙස සකස් කිරීම
7. සාමාජික ප්‍රතිලාභ වැඩි කිරීම
8. විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිතය
9. රජයේ දේශපාලන ඇගිලි ගැසීම් අවම කිරීම

සමුපකාර සම්බන්ධ බලධාරී ආයතන

- සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
  ශ්‍රී ලංකාව තුළ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම, විගණනය, පාලනය, අරමුදල් ලබා දීම, උපදෙස් දීම ආදී කටයුතු සිදුකරන්න ප්‍රධාන ආයතනයයි.

- සමුපකාර සේවා කොමිෂන් සභාව
  සමුපකාර සමිති වල සේවය කරන සේවකයන්ගේ පත්වීම්, මාරුවීම්, විනයානුකූල කටයුතු යනාදීය පිලිබඳ වූ විවිධ ගැටළු සලකා බලා ඒවා විසඳීමට ක්‍රියා කරන කමිටුව මෙයයි.

- ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
  මෙරට සමුපකාර ව්‍යාපාරයේ ජාතික මට්ටමේ සංවිධානය මෙයයි. සමුපාකාර ප්‍රතිපත්ති ආරක්ෂා කිරීම, රජයට උපදෙස් දීම, ජාත්‍යන්තර සමුපාකාර සමිති සමග සබඳතා පවත්වා ගැනීම, සමුපකාර සමිති වල කළමනාකරණය සම්බන්ද උපදෙස් දීම මෙමඟින් සිදු කරයි.

- සමුපාකාර කළමනාකරණ ආයතනය
  සමුපාකාර සමිති විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කළමනාකරණ ශිල්පීය දැනුම ව්‍යාප්ත කිරීමට උපදෙස් දීම, සමුපකාර අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම, සේවකයින් පුහුණු කිරීම, සමුපකාර පිලිබඳ සමීක්ෂණ පැවැත්වීම මෙමගින් සිදු කරයි.

විවෘත බව, අවංක බව, සමාජ වගකීම, අන්‍යයන් ගැන සැලකිලිමත් වීම සමුපාකාර සාරධර්ම වන අතර, ස්වයං උපකාරය, ස්වයං වගකීම, ප්‍රජාතන්ත්‍රවාදී බව, සමානාත්මතාවය සමුපාකාර අගනාකම් වේ.

## වරලත් ව්‍යාපාර

**"කිසියම් භාණ්ඩයක් හෝ සේවයක් සපයන ව්‍යාපාර ආයතනයක් තම නිෂ්පාදිතය වෙනත් නිශ්චිත වෙළඳපල ප්‍රදේශයක අලෙවි කිරීම සඳහා තවත් ව්‍යාපාර ආයතනයකට අවස්ථාව ලබා දීමට යොදා ගන්නා සංවිධාන ක්‍රමය" වරලත් ව්‍යාපාර නම් වේ.**

වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව දෙකකි.

1. වරලත්හිමියා
2. වරලත්ලාභියා

වරලත් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී වරලත්ලාභියා සහ වරලත්හිමියා අතර ඇති කරගන්නා ගිවිසුම "වරලත් ගිවිසුම" ලෙස හඳුන්වයි. මෙම ගිවිසුම යටතේ වරලත්හිමියගේ ව්‍යාපාර නාමය, වෙළඳ ලකුණ සහ ලාංඡනය භාවිත කිරීමට වරලත්ලාභියාට අවසර ලැබෙන අතර ගිවිසුම තුළ ව්‍යාපාරය පවත්වාගෙන යාමට අදාළ නීතිරීති, වරලත්හිමියා විසින් සපයන සේවා සහ මූල්‍ය කොන්දේසි, වරලත්ලාභියාගේ පුරස්කාර ගාස්තු ආදිය පිලිබඳ සඳහන් වෙයි.

- වරලත්හිමියා විසින් වරලත්ලාභියාට සපයන පහසුකම්
  1. සිය වෙළඳ නාමය භාවිතයට අවසර දීම.
  2. කළමනාකරණ පුහුණුව ලබා දීම.
  3. අලෙවිකරණ සහාය ලබා දීම.
  4. මූල්‍ය පහසුකම් ලබා දීම.
  5. වෙළඳසැල් නිමාව සකස් කර දීම.
  6. භාණ්ඩ හා උපකරණ සැපයීම.
  7. ශිල්පීය ඥානය ලබා දීම.

- වරලත්ලාභියා විසින් වරලත්හිමියාට ඉටු කල යුතු දෑ
  1. වරලත්හිමියා පනවන කොන්දේසි අනුව කටයුතු කිරීම.
  2. ප්‍රාග්ධනය ආයෝජනය කිරීම.
  3. වරලත්හිමියා විසින් නිර්දේශිත සැපයුම්කරුවන්ගෙන් පමණක් ද්‍රව්‍ය මිලදී ගැනීම.
  4. වරලත්හිමියාට මාසික පුරස්කාරය ගෙවීම.

### වරලත් ව්‍යාපාර වර්ග

**1)** නිෂ්පාදන වරලත් ව්‍යාපාර
වරලත්හිමියාගේ වෙළඳ ලකුණ යටතේ භාණ්ඩ නිෂ්පාදනය කර බෙදා හැරීමට වරලත්හිමියාට අයිතිය පැවරෙන ව්‍යාපාරයි.
උදා: පෙප්සිකෝලා, කොකාකෝලා

**2)** නිෂ්පාදිත වරලත් ව්‍යාපාර
වරලත්හිමියාගේ වෙළඳ ලකුණ යටතේ භාණ්ඩ මිලදීගෙන නැවත විකිනීමට වරලත්ලාභියාට අයිතිය හිමිවන ව්‍යාපාර වේ.
උදා: ඛනිජ තෙල් විකිණීමේ අලෙවිසැල්

**3)** ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර
වරලත්හිමියාගේ නමින් මෙන්ම ව්‍යාපාර ක්‍රමය යටතේ ව්‍යාපාර පවත්වාගෙන යාමට වරලත්ලාභියාට අයිතිය පැවරෙන ව්‍යාපාරයි.
උදා: **KFC, McDonalds,**

## වරලත් ව්‍යාපාර ක්‍රමයේ වාසි-අවාසි

1) වරලත්හිමියාට

| වාසි | අවාසි |
|---|---|
| • ආයෝජනයකින් තොරව ව්‍යාපාරය පුළුල් කල හැකි වීම.<br>• ව්‍යාපාරයේ පූර්ණ ධාරිතාව කරා ඉක්මනින් ළඟාවිය හැකි වීම.<br>• ව්‍යාපාරය ලොව පුරා ප්‍රචලිත කිරීමට අවස්ථාව ලැබීම.<br>• විශාල පුරස්කාරයක් ලැබීම.<br>• වරලත්ලාභියාගේ දක්ෂතා වලින් වාසි ලැබිය හැකි වීම.<br>• ව්‍යාපාර නාමය අලෙවි කිරීමෙන් පමණක් ආදායම් ඉපයිය හැකි වීම. | • ගිවිසුම අනුව කටයුතු කිරීමේදී සිදුවන අවාසි<br>• ආයෝජනය පිලිබඳ අවධානමක් පැවතීම.<br>• තම කීර්තිනාමය වරලත්ලාභියාගේ ක්‍රියාවන් මත පලුදු වීමට ඇති ඉඩකඩ.<br>• වරලත්ලාභින් උපයන ආදායමින් වැඩි කොටසක් ඔවුන් විසින්ම රඳවා ගැනීම. |

2) වරලත්ලාභියාට

| වාසි | අවාසි |
|---|---|
| • පුළුල් හා විශාල ව්‍යාපාරයකට පිවිසීමට අවස්ථාව ලැබීම.<br>• ප්‍රවර්ධන පිරිවැය අඩු වීම.<br>• ආයෝජනයේ ප්‍රතිලාභ කෙටි කලකින් ලබා ගත හැකි වීම.<br>• ආරම්භයේ සිටම ලාභ ලැබිය හැකි වීම.<br>• වරලත්හිමියාගේ විවිධ පහසුකම් හිමිවීම.<br>• අසාර්ථක වීමේ ප්‍රවණතාව අඩු වීම. | • පූර්ණ නිදහසක් හිමි නොවීම.<br>• වරලත් ගිවිසුම අනුව කටයුතු කිරීමට සිදුවීම.<br>• විශාල පිරිවැයක් දැරීමට සිදු වීම.<br>• පූර්ණ ස්වාධීනත්වයක් හිමි නොවීම.<br>• වරලත්ලභියා දැඩි පීඩනයකට හසු වීම.<br>• ආයෝජනය පිලිබඳ අවධානමක් පැවතීම. |

## <u>ව්‍යාපාර සංයෝජන</u>

**සමාගම් දෙකක් හෝ කිහිපයක් එකට එකතු වී කටයුතු කිරීම ව්‍යාපාර සංයෝජන ලෙස හැඳින්විය හැකිය.**

**ව්‍යාපාර සංයෝජනය වීම ප්‍රධාන ක්‍රමවේද දෙකකින් සිදු විය හැකිය.**

1) *ඒකාබද්ධ වීම*
   **වෙන්වෙන්ව පැවති සමාගම් දෙකක් හෝ කිහිපයක් තනි ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීමයි. මෙය ප්‍රධාන ක්‍රම දෙකකට සිදු විය හැකිය.**
   a. **එක් සමාගමක් අනෙක් සමාගමේ වත්කම් හා වගකීම් මිලට ගැනීම**
   b. **සංයෝජනය වන ව්‍යාපාර දෙක හෝ කිහිපය නිමා කර නව සමාගමක් පිහිටුවීම**

2) *අත්පත්කර ගැනීම*
   **එක් සමාගමක් විසින් අනෙක් සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් වැඩි ප්‍රමාණයක් මිලට ගැනීම.**

**මෙම ව්‍යාපාර සංයෝජන ප්‍රධාන ක්‍රම 03කට සිදු විය හැකිය.**

1) **තිරස් සංයෝජන**
   **එක සමාන ව්‍යාපාර කටයුතු වල යෙදී සිටින සමාගම් දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ වීම**
   **උදා : සපත්තු නිෂ්පාදන ආයතන දෙකක් ඒකාබද්ධ වීම**

2) **සිරස් සංයෝජන**
   **ව්‍යාපාර දාමයේ එකම අවස්ථාවක හෝ එක සමාන කටයුත්තක නිරත ආයතන දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ වීම**
   **උදා : සපත්තු නිෂ්පාදන සමාගමක් සම් නිෂ්පාදන සමාගමක් සහ සපත්තු අලෙවිකරණ සමාගමක් සමග ඒකාබද්ධ වීම**

3) **විෂම සංයෝජන**
   **විවිධ ව්‍යාපාර දාමයන්හි වවිධ අවස්ථාවන්හි දී සිටින, එනම් වෙනස් වර්ගවල ව්‍යාපාර සංයෝජනය වීම**
   **උදා : සපත්තු නිෂ්පාදන සමාගමක් බිස්කට් නිෂ්පාදන සමාගමක් සමග ඒකාබද්ධ වීම**

රාජ්‍ය අංශයේ ව්‍යාපාර

- පොදු හිමිකාරිත්වය යටතේ ව්‍යාපාර පවත්වාගෙන යාමට හේතු
    1. ඒකාධිකාරය පාලනය කිරීමට
    2. ලාභදායි නොවන එහෙත් අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට
    3. පෞද්ගලික අංශය විසින් අහිතකර ලෙස ලාභ ඉපයීම පාලනය කිරීමට
    4. වැදගත් මහා පරිමාණ සංවර්ධන යෝජනාක්‍රම පවත්වාගෙන යාමට
    5. නාස්තිය අවම කිරීමට
    6. පෞද්ගලික අංශය හා තරඟ කිරීමේ අවශ්‍යතාව
    7. ජාතික ආරක්ෂාවට සිදු විය හැකි තර්ජන පාලනය කිරීම
    8. පොදු ජනතාවට සාධාරණ මිලට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට

රාජ්‍ය සංස්ථා

සමාගම් පනත හැර වෙනත් ලිඛිත නීතියක් යටතේ පිහිටවන ලද, රජය විසින් ප්‍රදානයක් වශයෙන් හෝ ණයක් වශයෙන් හෝ අරමුදල් සපයන ලද සංවිධානයක්, රාජ්‍ය සංස්ථාවක් ලෙස හඳුන්වයි.

මේවා දෙපාර්තමේන්තුවලින් වෙනස් වන්නේ රාජ්‍ය සංස්ථා එහි අදායම භාණ්ඩ හා සේවා විකිණීමෙන් ලබා ගන්නා බැවිනි.

මේවා රාජ්‍ය නීතිගත සංස්ථාව, සමායතනය, කොමිසම, අධිකාරිය, සංයුක්ත මණ්ඩලය, කොමිෂන් සභාව, මණ්ඩලය, කාර්යාංශය, සභාව යන නම් වලින්ද හඳුන්වයි.

උදා : ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

රාජ්‍ය සංස්ථාවක ප්‍රධාන අරමුණ වන්නේ අවම මිලකට කාර්යක්ෂම සේවාවක් ජනතාවට සැපයීමයි.

රාජ්‍ය සංස්ථාවක් පිහිටුවිය හැකි ප්‍රධාන ආකාර දෙකකි.

1. පොදු පාර්ලිමේන්තු පනතක් මගින්
2. විශේෂිත පාර්ලිමේන්තු පනතක් මගින්

රාජ්‍ය සංස්ථාවක ලක්ෂණ

1. පූර්ණ වශයෙන් හෝ වැඩි අයිතිය රජයට හිමි වීම.
2. විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාපනය කරයි.
3. රජය, මහජනතාව, පෞද්ගලික අංශය ප්‍රාග්ධනයට දායක වීම.
4. වගකීම අසීමිත ය.
5. නෛතික පුද්ගලභාවයක් ඇත.
6. අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය සිදුවේ.
7. ගිණුම්කරණය හා විගණනය අනිවාර්ය වීම.

රාජ්‍ය සංස්ථා අකාර්යක්ෂමයැයි පිළිගැනීමට හේතු

- දේශපාලන ඇඟිලි ගැසීම් බහුල වීම
- තීරණ ගැනීම ප්‍රමාද වීම
- දූෂණ හා වංචා කටයුතු අධික වීම
- සම්පත් නාස්තිය අධික වීම
- සේව්‍ය-සේවක දෙපක්ෂය අතර පවතින මතභේදකාරී තත්වයන්
- ඇතැම් සංස්ථා අධිධාරිතාවයෙන් යුක්ත වීම

## රාජ්‍ය දෙපාර්තමේන්තු

**පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වය සහ අමාත්‍යාංශගත පාලනයක් යටතේ රාජ්‍ය ප්‍රතිපත්ති වලට එකගව ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන ආයතන විශේෂයකි.**

**විවිධ සේවාවන් සැපයීම සදහා රාජ්‍ය දෙපාර්තමේන්තු ක්‍රියාත්මක වේ.**

**උදාහරණ ලෙස,**

- අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
- දුම්රිය දෙපාර්තමේන්තුව

### රාජ්‍ය දෙපාර්තමේන්තු වල ලක්ෂණ

1. රජයේ සෘජු පාලනයට යටත් වීම.
2. පූර්ණ අයිතිය රජය සතු වීම.
3. වගකීම අසීමිත වීම.
4. නෛතික පුද්ගලභාවයක් නොමැත.
5. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි ආදී ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කිරීම.
6. රජයේ වාර්ෂික අයවැය මගින් අරමුදල් ප්‍රතිපාදනය කිරීම.
7. සියලු ලාභ හා අදායම් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරෙයි.
8. බොහෝ විට සේවා සැපයීමෙහි නිරතවීම.

### දෙපාර්තමේන්තු අකාර්යක්ෂමයැයි පිළිගැනීමට හේතු

- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි වැනි ප්‍රතිපත්ති වලින් ඇති වන දැඩි බලපෑම
- නිලධාරිවාදය තදින්ම ක්‍රියාත්මක වීම.
- අරමුදල් සම්පාදනය සීමා වීම.

## රාජ්‍ය සමාගම්

**මුළු ප්‍රාග්ධනයෙන් 50% කට වැඩි ප්‍රමාණයක් හෝ පූර්ණ අයිතිය රජය සතු, 2007 සමාගම් පනත යටතේ ලියාපදිංචි කල සමාගම් රාජ්‍ය සමාගම් ලෙස හදුන්වයි.**

**මේවා රජයේ පොදු සමාගම් හා රජයේ පෞද්ගලික සමාගම් ලෙස කොටස් දෙකකි.**

**උදාහරණ ලෙස,**

- ශ්‍රී/ස විදුලිබල (පෞද්) සමාගම
- ශ්‍රී/ස ලංකා හොස්පිටල්
- ශ්‍රී ලංකා රක්ෂණ සමාගම
- ශ්‍රී/ස ලංකා පොස්පේට් සමාගම
- ශ්‍රී/ස ලිට්‍රෝ ගෑස් සමාගම

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."